හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කර්මාන්ත 43 ක ණයහිමියෝ රු.4,070,288 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ගිණුම් නිවැරදි කර ඇත. |
| (ආ) | ණයහිමි වටිනාකම රු.250,446 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර්මාන්ත ණයහිමි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | ජ'නල් මඟින් ගිණුම්ගත කර ඇත. |
| (ඇ) | ගබඩා භාණ්ඩ ලැබීම් වටිනාකම, රු.149,417 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | සමහර මිලදී ගැනීම් ගබඩාවට ගෙන තොග ගිණුමට ගිණුම්ගත නොවී වැඩසටහන් වියදම්වලින් ගිණුම්ගත වී තිබීම මෙම වෙනසට හේතු වී ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් රු.1,154,760 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | ගිණුම් දෝෂ නිවැරදි කර 2019.12.31 දිනට අවසන් ගිණුම් නිවැරදිව සාදන බව දන්වමි. |
| (ඉ) | වාර්ෂික කඩ කුලී රු.406,000 ක් ද වාර්ෂික ස්ථාවර තැන්පතු පොලි ආදායම රු.11,535,417 ක් ද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | ගිණුම් දෝෂ නිවැරදි කර 2019.12.31 දිනට අවසන් ගිණුම් නිවැරදිව සාදන බව දන්වමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ උපකරණ වැය වියදම් රු.451,520 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | ගිණුම් දෝෂ නිවැරදි කර 2019.12.31 දිනට අවසන් ගිණුම් නිවැරදිව සාදන බව දන්වමි. |

1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූලා ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 08 ක ශේෂ උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී, රු.8,391,374 ක නොසැසඳීමක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ගිණුම් දෝෂ නිවැරදි කර, 2019.12.31 දිනට අවසන් ගිණුම් නිවැරදිව සාදන බව දන්වමි. |

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවුරුදු 05 ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.877,112 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමි. |

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

| | | |
| --- | --- | --- |
| අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.95,939 ක් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩිනමින් ණයහිමි ශේෂ ගෙවා අවසන් කිරීමට කටයුතු කරමි. |

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තොග ලේඛන, ලිපිගොනු, ආදායම් ලේඛන හා අත්තිකාරම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.3,079,609 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේ දී, සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ලේඛන යාවත්කාලීන කර, 2019 අවසන් ගිණුම ඉදිරිපත් කරන අවස්ථාවේ දී, ඉදිරිපත් කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් එකතු කිරීම සඳහා ජංගම සේවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | 571(3) | වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු 83 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රජයේ ආදායමට ගැනීමට හෝ අදාළ පුද්ගලයින්ට ගෙවීමට කටයුතු කරමි. |
| (ii) | 1646 | වාහනවලට අදාළ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් විෂයය නිලධාරීන් සහ රියැදුරන් දැනුවත් කර ඇත. |
| (ඇ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | | | |
| | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වසර 05 කට වරක් බල ප්‍රදේශයේ ඇති සියලුම නිශ්චල දේපළ තක්සේරු කළ යුතු වුව ද, 2011 වර්ෂයෙන් පසුව තක්සේරුවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, කටයුතු කළ යුතු වේ. | 2017 වසරේ සිට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළ ද, ඒ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත. |

1.5 <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් අධිකාරී බලයක් නොමැතිව පෙර වර්ෂවල එකතුව රු.5,727,099 ක් වූ කර්මාන්ත ණයහිමි හා කර්මාන්ත ණයගැති ශේෂයක් වර්ෂය තුළ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,546,011 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,794,420 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018 2017

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 11,720,665 | 11,196,750 | 10,959,827 | 4,830,771 | 11,281,000 | 11,790,150 | 11,067,117 | 5,755,314 |
| (ii) | කුලී | 2,662,600 | 1,586,510 | 1,627,680 | 24,090 | 1,853,000 | 1,379,230 | 1,443,320 | 62,010 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,874,200 | 2,476,266 | 2,482,266 | 18,000 | 2,400,000 | 2,298,541 | 2,423,070 | 21,405 |
| (iv) | වෙනත් ආදායම් | 47,029,500 | 52,974,896 | 53,353,773 | 97,750,424 | 45,663,400 | 45,972,587 | 17,089,025 | 66,994,365 |
| | එකතුව | 64,286,965 | 68,234,422 | 68,423,546 | 102,623,285 | 61,197,400 | 61,440,508 | 32,022,532 | 72,833,094 |

2.2.2 <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 කට වඩා වැඩි රු.85,750 ක හිඟ අක්කර බදු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය වර්ධනය කර ගත යුතු වේ. | බදු හිමියන් හඳුනාගත නොහැකි බැවින්, අනුමැතිය ලබා ගෙන හිඟ මුදල කපා හැරීමට කටයුතු කරමි. |

2.2.3 <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නළ ළිං ආදායම | | |
| | බල ප්‍රදේශයේ පවතින ක්‍රියාකාරී නළ ළිං 29 ක් වෙනුවට 328 ක් සඳහා බිල් කර තිබූ බැවින්, 2018 වර්ෂයේ අවසානයට හිඟ නළ ළිං ආදායම රු.801,163 ක් වී තිබුණි. | නිවැරදි බිල් කිරීම් කරමින් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතු වේ. | දිගින් දිගටම වැරදි සහගත ලෙස බිල් කර ඇති රු.801,163 ක මුදල විධිමත් පරිදි කපා හැරීමට කටයුතු කරමි. |
| (ආ) | ත්‍රීරෝද රථ ගාස්තු | | |
| (i) | වර්ෂය ආරම්භයට පැවති රු.536,400 ක හිඟ මුදලින් වර්ෂය අවසන් වන විට රු.391,500 ක මුදලක් අය කර නොතිබුණි. | හිඟ ත්‍රීරෝද රථ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතු වේ. | හිඟ ත්‍රීරෝද රථ ගාස්තු ගෙවන ලෙස ත්‍රීරෝද රථ හිමියන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරමි. |
| (ii) | ත්‍රී රෝද රථ සම්බන්ධව 2014 වර්ෂයෙන් පසුව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කළ යුතු වේ. | මෙම වර්ෂයේ සමීක්ෂණයක් සිදු කර හිඟ අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම | | |
| (i) | වෙළඳ ආයතන 19 ක ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 82 ක් සඳහා අය විය යුතු රු.179,149 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. | සභාවට ලැබිය යුතු ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුදල් ගෙවන ලෙස අදාළ ආයතන සඳහා ලිපි යොමු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු නියමිත පරිදි සිදු කළ යුතු වේ. | එම සමීක්ෂණය සිදු කිරීම සඳහා මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. |

2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.2,108,233 ක් හා රු.59,609,106 ක් විය. | ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය වර්ධනය කර ගත යුතු වේ. | 2019 වර්ෂයේ උසාවි දඩ රු.1,295,034 ක් හා මුද්දර ගාස්තු රු.3,849,360 ක් ලැබී ඇත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>කර්තව්‍යයන් ඉටු නොකිරීම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශයේ පවතින ප්‍රජා ජල ව්‍යාපෘති 07 ක හා සභාවේ එක් ජල ව්‍යාපෘතියක ජල සාම්පල් පරීක්ෂා කිරීමකින් තොරව බෙදා හරිමින් තිබුණි. | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | ජල සාම්පල් පරීක්ෂාවක් සිදු නොකළ බව පිළිගන්නා අතර, මෙම වර්ෂයේ ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ කාන්තා අභිවෘද්ධි, ප්‍රජා සංවර්ධන හා දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් යනාදී අයිතම 09 ක් යටතේ රු.540,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. | මෙම වැඩසටහන් සඳහා වැඩසටහන් සකස් කර මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන කසළ යොදා ගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනය තුළින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට දායකත්ත්වයක් ලබා දීමට කටයුතු කළ යුතු වේ. | ඉඩමක් සොයා ගත් පසු කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට 2018 වර්ෂය තුළ සැලසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට අදාළ සැලසුම් සකස් කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා වූ අයවැය මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සම්බන්ධව තොරතුරු ලබා ගෙන ආදායම් අය කිරීම කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වේ. | සංචාරක මණ්ඩලයෙන් අදාළ තොරතුරු ලබා ගැනීමට දන්වා යවා ඇති අතර, තොරතුරු ලද වහාම මෙම වසරේ සිට අය කර ගැනීමට බලාපොරොත්තු වෙමි. |
| (ආ) | 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ලද රු.1,344,540 ක ත්‍යාග මුදල් ප්‍රාදේශීය සභා සංවර්ධනයට උපයෝජනය කර නොතිබුණි. | සභාවේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි මුදල් ඒ සඳහා විධිමත්ව යොදා ගත යුතු වේ. | මෙම ත්‍යාග මුදල් මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 10 ක් හා අතිරික්ත තනතුරක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට හා අතිරික්ත තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පෙර පාසැල් ගුරු තනතුරු 02 ක් අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති අතර, අනෙකුත් පුරප්පාඩු තනතුරු පුරවා ගැනීම සඳහා අදාළ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | සේවය හැර ගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අය විය යුතු රු.169,822 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර නොතිබුණි. | සේවක ණය අය කර ගැනීමේ ක්‍රමවේදය තවදුරටත් ක්‍රමවත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර, ස්ථාන මාරු වී ගිය සේවකයින්ගේ ණය වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ඇ) | කාර්ය මණ්ඩල පුහුණුවීම් සඳහා වෙන් කර තිබූ රු.200,000 ක වටිනාකමින් රු.146,983 ක මුදලක් උපයෝජනය කර නොතිබුණි. | පුහුණු වැඩසටහන් මඟින් කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය වර්ධනය කර ගත යුතු වේ. | පුහුණු වැඩසටහන් සැලැස්ම අනුව, සිදු කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය තුළ දී, මහජන පැමිණිලි 168 ක් ලැබී තිබූ නමුත්, පැමිණිලි 89 ක් පරීක්ෂා කර විසඳීමට කටයුතු කර නොතිබුණි. | මහජන පැමිණිලි පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. | කඩිනමින් මහජන පැමිණිලි විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරමි. |
| (ආ) | පරිසරයට හානි වන ආකාරයෙන් පවත්වා ගෙන යනු ලබන වාහන සේවා ආයතනයට කිසිදු පරීක්ෂාවකින් තොරව 2017 ඔක්තෝබර් 16 සිට 2018 ඔක්තෝබර් 15 දක්වා පරිසර බලපත්‍රය නිකුත් කර තිබුණි. | නිවැරදි තහවුරුවක් තුළින් වෙළඳ බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී, තොරතුරු විගණනයට ඉදිරිපත් කරන බව දැනුම් දී ඇත. |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

<u>නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවන තත්ත්වයේ පවතින රු.18,198,144 ක වටිනාකමින් යුත් වාහන 07 ක් වසර 01 සිට වසර 04 දක්වා කාල පරාසයක් තුළ ඌන උපයෝජිතව ගාල් කර තිබුණි. | වත්කම් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත නොවන අයුරින් කටයුතු කළ යුතු වේ. | වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට ප්‍රධාන අමාත්‍යාංශය වෙත යවා ඇත. |

3.6 <u>ප්‍රසම්පාදනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

<u>අයවැය පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් වෙන් කර තිබූ රු.4,000,000 ක ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි. | සභාව සතුව පවතින ඉඩම්, ගොඩනැගිලිවල නිරවුල් අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී, සුසාන භූමි වටා වැට සකස් කර ආරක්ෂා කර ගැනීමට කටයුතු සිදු කරමි. |